**#mediaethicsSL #SinhalaPress #lka #SundayDivaina #August19**

මෙම දිවයින ලිපිය මගින් වැලිකඩ බන්ධනාගාරයේ කාන්තා රැඳවියන් පිරිසක් විසින් එහි වහලය මතට නැග සිදුකළ විරෝධතාවය සම්බන්ධයෙන් ආවරණය කොට තිබිණි. මෙම ලිපියේ අන්තර්ගතය තුළ එම කාන්තා රැඳවියන්ගේ ඉල්ලීම් සහ එම සිදුවීමේ පසුබිම් කථාවන් දක්වා තිබිණි. කෙසේ නමුත් මෙහි සිරස්තලයේ "කුඩු සික් වැදී" යනුවෙන් ඇති කොටස අවධානයට ගත යුතුවේ. මෙම විරෝධතාවයට සම්බන්ධ කාන්තා රැඳවියන්ගෙන් වැඩි දෙනෙකු මත්කුඩු සම්බන්ධ චෝදනා යටතේ සිරදඬුවම් විඳින බවද ලිපිය තුළ සඳහන් වේ. නමුත් "කුඩු සික්" යනුවෙන් සිරස්තලය යොදමින් ගම්‍යමාන කරන්නට තැත් කරනා අදහස කුමක්ද? මත්ද්‍රව්‍ය භාවිතය නැවැත්වීමට සිදුවීම නිසා මෙම විරෝධතාවය දියත් කළ බවද? එසේත් නැතිනම් මත්ද්‍රව්‍ය ජාවාරම් කටයුතු සඳහා නව බන්ධනාගාර වැඩපිළිවෙල මගින් එල්ල වන තර්ජනය ඉවත් කරනු වස්, වෙනත් ඉල්ලීම් දඩමීමා කරගනිමින් විරෝධතාවයක් දියත් කළ බවද? එසේත් නැතිනම් මෙය හුදු අර්ථය නොදැන පළ කරන්නට යෙදුණු සිරස්තලයක් පමණක්ද? එය පාඨක අවධානයට යොමු විය යුතු කරුණකි.